NMSG Library

# පක්ෂයේ මග පෙන්වීමේ චින්තනයේ සංවර්ධනයට ජාත්‍යන්තර බලපෑම

නිර්ධන පංතිය අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර පංතියක් වන නිසාම, නිර්ධන පංති විප්ලවයේ සංවර්ධනය අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර මට්ටමේ මතවාදී අරගලය සහ පංති අරගලය ජාත්‍යන්තර මට්ටමේම ගෙන යාමේ හේතුවෙන් සිදුවේ. අපේ පක්ෂයේ මග පෙන්වීමේ චින්තනය, ජාත්‍යන්තර තලයේ මාක්ස්වාදය, ලෙනින්වාදය, මාඕවාදය සංවර්ධනයේ දම්වැලෙහි පුරුකක් ලෙස අප වටහා ගත යුතුය.

නිර්ධන පංතිය විප්ලවීය විද්‍යාවේ නිර්මාතෘවරුන් වූ මාක්ස් හා එංගල්ස්ගේ ජීවිත කාලයේදී මූලික වශයෙන් ඇනාකිස්ට්වරුන්ටත් පසුව වේදිකාවේ පෙනී සිටි ප්‍රතිසංස්කරණවාදීන්ටත්, නිර්ධන පංති නොවන විවිධ වර්ගයේ ප්‍රවණතාවයන්ට එරෙහිව කළ මහා අරගලයකින් මාක්ස්වාදය සංවර්ධනය විය. මාක්ස් හා එංගල්ස්ගේ අභාවයෙන් පසුව ධනවාදයේ සංවර්ධනය අධිරාජ්‍යවාදය බවට පත්වීමත් සමග ලෝකයේ විෂය මූලික හා මනෝමූලික තත්ත්වයන් දෙකෙහිම අරගල වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් **''මාක්ස්වාදය''** ප්‍රධාන ප්‍රවණතාවයන් දෙකක් ලෙස විද්‍යාමාන විය. එක් පැත්තක විප්ලවිය ප්‍රවණතාවයයි. අනෙක් පැත්ත ප්‍රතිවිප්ලවවාදී ප්‍රතිසංස්කරණවාදී ප්‍රවණතාවයයි. විපලවීය ධාරාව රාජ්‍යයේ පංති ස්වභාවය, බලහත්කාර විප්ලවය, නිර්ධන පංති ආඥාදායකත්වය විප්ලවය නොකඩවා කරගෙන යාම නගා සිටුවීය. ලෙනින්, ස්ටාලින්, මාඕගේ ප්‍රතිපත්තිමය නායකත්වය යටතේ මාක්ස්වාදය, ලෙනින්වාදයට, මාඕවාදයට වර්ධනය විය. අනෙක් පැත්තෙන් ඊට සමාන්තරව ප්‍රතිසංස්කරණවාදී, විප්ලවවාදී ප්‍රවණතාවය පංතිවලට ඉහළින් **''රාජ්‍යය''** සාමකාමී පරිවර්තනය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයන් ගැන දේශනා කරමින් බර්න්ස්ටයින්, කෞට්ස්කි, කෲෂෙප් සහ තවත් අයගේ නායකත්වය යටතේ පිරිහීම නොකඩවා කරගෙන ගියේය. අවසානයේදී යෙල්ට්සිංගේ නිරුවත් දිය කර හැරීමේවාදය විය. (නිරුවත් ධනවාදය) පැරිස් කොමියුනයෙන් ඔක්තෝබර් විප්ලවයට, ඔක්තෝබර් විප්ලවයෙන් සහ ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයෙන් විප්ලවයේ අත්දැකීම් ශක්තිමත් විය. විෂය මූලික තත්ත්වයන්ගේ වෙනස් වීම් වලට අනුව නිර්ධන පංති විප්ලවයේ මූලික සත්‍යයත් නිර්මාණාත්මකව යෙදවීම නිසාම මාක්ස්වාදයේ නවතම සංවර්ධනය මාක්ස් - ලෙනින් - මාඕවාදය ලෙස ඉහළටම ළඟා වී පෙරමුණ ගෙන සිටී. විප්ලවිය විද්‍යාවේ මූලික සත්‍යයන්ගේ හරිවැරදි බැලීමේ ප්‍රයත්නය හෝ අත්හැර දැමීම, අවසානයේ දියවී යාම හෝ ප්‍රතිවිප්ලවයේ උපකරණයක් බවට විකෘති වේ. විසිවෙනි ශතවර්ෂය අවසානයේ සංශෝධනවාදී නායකත්වය යටතේ සමාජවාදී රටවල් සියල්ලේමත්, මෑත කාලයේ රුසියාව සහ චීනය ඇතුළුව ප්‍රතිවිප්ලවීය සිදුවීම් වලින් මාඕගේ කාලපරිච්ඡේදය වනතුරු නිර්ධන පංති විප්ලවයේ විද්‍යාව වූ මාක්ස්වාදය, මාක්ස් - ලෙනින් - මාඕවාදය සංවර්ධනය වූ බව සනාථ කළේය. අනෙකුත් සියල්ලම මාක්ස්වාදයේ හුදු ප්‍රලාපයන්ය. 1976 දී මාඕගේ අභාවයෙන් සහ චීන ප්‍රතිවිප්ලවයෙන් පසු සිය රටවල්වල මාක්ස් - ලෙනින් - මාඕවාදය අඛණ්ඩව ගෙනගිය මාඕවාදී පක්ෂ සමහරක් සහ පේරුවේ කොමියුනිස්ට් පක්ෂය වැනි කොමියුනිස්ට් පක්ෂ විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය පිහිටුවීය. මෙම විප්ලවීය ජාත්‍යන්තරවාදී නිර්ධන පංති ව්‍යාපාරයේ අඛණ්ඩ කොටසක් ලෙස අපේ පක්ෂය නේපාලය තුළ මාක්ස් - ලෙනින් - මාඕවාදයේ විප්ලවීය විද්‍යාව යොදවා ඇත. මේ හේතුවෙන් මාක්ස් - ලෙනින් - මාඕවාදය **''අපේ පක්ෂයේ මග පෙන්වන චින්තනය''  ලෙස කැටි ගැසී ඇත.**

මාක්ස් - ලෙනින් - මාඕවාදය සංවර්ධනය  කරමින්, නගාසිටුවමින් ආරක්ෂා කරන අතර, මෙම විද්‍යාවේ ඉහළම මුදුන වූ චීනයේ ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයේ අත් දැකීම් තව දුරටත් ඉහළ තලයට ගෙන යමින් අපේ පක්ෂය කරන ලද බරපතල කාර්‍යය එය ග්‍රහණය කර ගැනීමයි. චීනයේ ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්වය **''පක්ෂයේ මග පෙන්වීමේ චින්තනය''**  සැබෑම මූලය නිසාම එහි මූලික හරය වටහා ගන්නේ නැතිව, පක්ෂයේ මග පෙන්වීමේ චින්තනය වටහා ගත නොහැකිය. රාජ්‍යයක තත්ත්වයෙන් රාජ්‍යයක් නොමැති කොමියුනිස්ට් සමාජය කරා පරිවර්තනය කිරීමට නිර්ධන පංති ආඥාදායකත්වය සහ විප්ලවය සඳහා නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය ලෙස කොමියුනිස්ට් පක්ෂයක නායකත්වය අනිවාරණීය අත්‍යවශ්‍ය බව මාක්ස් - ලෙනින්වාදයේ පිළිගත් මූලිත සත්‍යයන් වෙයි. පිළිගත් මතයන් දෙකම නගා සිටුවන විප්ලවීය කොමියුනිස්ට් කඳවුර ගැන පමණක් අප කථා කරන්නේ නම් මේ මූලික සත්‍යයන් ඉවත දමන ප්‍රතිගාමීන් හා සංශෝධනවාදීන්ගෙන් ඉවත් විය යුතුය. මන්දයත් චීනය හා රුසියාව ඇතුලත්ව සියලුම රටවල එම නායකත්වය යටතේ ප්‍රතිවිප්ලවීය සිදු වීම්ද, සමාජවාදී රාජ්‍ය සහ කොමියුනිස්ට් පක්ෂ අතුලතින්ම අලුත් නිළධාරිවාදී ධනපති පංති මූලයන්ගෙන් අතීත දරුණු සිදුවීම් වලට විද්‍යාත්මක විසඳුම් සපයමින් මාක්ස්වාදයේ ඉහළම සම්බන්ධතාවයෙන් නව අදියරකට පත්විය. තවත් වචනයකින් සමාජවාදී රාජ්‍යයක නව (ප්‍රජාතන්ත්‍ර) සහ කොමියුනිස්ට් පක්ෂයක සැබෑ නිර්ධන පංති ආඥාදායකත්වය පවත්වා ගැනීමටත්, නිර්ධන පංති ආඥාදායක්වය යටතේ පංති රහිත සමාජයක් කරා ගෙනයාමේ යෝග්‍ය ක්‍රමයක් ලෙස මාඕගේ කාලයේදී මාක්ස් - ලෙනින්වාදය තුළ ඉතා විවේචනාත්මක ක්‍රමයක් කරලියට ආවේය. ඇත්තෙන්ම එය වහා සුදානම් කර තිබූ ක්‍රමයක් නොවීය. එය විද්‍යාත්මක ක්‍රමයක්ම විය. (විප්ලවීය ද්වීඝටනය අඩංගු වූ) මාඕගේ නායකත්වය යටතේ සංවර්ධනය කළ **''නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ විප්ලවය අඛණ්ඩව ඉදිරියට ගෙන යෑම''** ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයේ සංකල්පයයි. එවැනි අලුත්ම විද්‍යෘත්මක ක්‍රමයකින් **''විමසීම''** අත්‍යාවශ්‍ය ලෙසටම මාක්ස් - ලෙනින්වාදය, මාක්ස් - ලෙනින් - මාඕවාදය දක්වා ඉහළටම නැංවීය.

දැන් අපි තවදුරටත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ **(ICM)** ඉතිහාසය දෙස හැරී බලමු. විසිවෙනි ශතවර්ෂය ආරම්භයේදී ලෙනින් සහෝදරයාගේ නායකත්වය යටතේ නිර්ධන පංති ආඥාදායකත්වයත්, සමාජවාදී රාජ්‍යය (සෝවියට් බලය) සංවිධානමය ලෙස නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය ලෙස කොමියුනිස්ට් පක්ෂය යන සංකල්පය වර්ධනය කළේය. පෙර අත්දැකීම් මඳ වීමද, මාඕගේ වචන වලින් ස්ටාලින් සහෝදරයාගේ චින්තනයෙහි පාර භෞතිකවාදය තිබුණි. සෝවියට් රුසියාවේ මුල් කාලයේ එය ක්‍රියාවට යෙදවූ අතර ස්ටාලින් සහෝදරයා විසින් යම් වැරදි හා අතපසුවීම් කර තිබුණි. එක් අතකින් සමාජයෙහි පංති පවතිනතුරු සෝවියට් සමාජයෙහි සහ කොමියුනිස්ට් පක්ෂය තුළ පංති තිබෙන බව නිවැරදිව ග්‍රහණය කරන්නට ස්ටාලින් සහෝදරයා අසමත් විය. කොමියුනිස්ට් පක්ෂය ගල් ටැඹක් මෙන් සැලකූ අතර පංති අරගලයක් තිබිය නොහැකි බව මවාගත්තේය. අනික් පැත්තෙන් ඔහු ක්‍රියාකාරීව සහභාගි වනවාට වඩා යාන්ත්‍රික සහ නිළධාරිවාදි ක්‍රමයක් අනුමත කළේය. බහු ජනතාව විරුද්ධව සටන් කළද, රාජ්‍යය සහ පක්ෂය තුළ නිර්ධන පංති බලවේගයන් සහ කණ්ඩායම් නොවීය. මේවායින් තොරව සමාජවාදය ගොඩ නැගීමේ ප්‍රශ්නය ආර්ථික නියතවාදය ලෙස ප්‍රචලිතව තිබුණි. මෙහි ප්‍රතිඵලය වශයෙන් ස්ටාලින් සහෝදරයා ඔහුගේ ජීවිත කාලය තුළ රාජ්‍යය නිර්ධන පංති පක්ෂය උසස් තත්ත්වයකට පත් කළද, ආරක්ෂා

කළද, ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් කොතරම් වුවද, ඔහුගේ මරණයෙන් පසු විප්ලවීය ජයග්‍රාහකයන්ගේ උත්පාදනය නොමැතිව එය දිගටම ගෙන යාමට නොහැකි විය. පක්ෂය සහ රාජ්‍යය ප්‍රතිවිප්ලවීය කෘෂෙව් විසින් අත්පත් කර ගත්තේය.

මෙය ඉතාමත් බරපතල ඉතිහාසීය තත්ත්වය යටතේ අලුත් ආකාරයකින් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ප්‍රශ්න විසඳීමේ ග්‍රහණය කිරීමේ උත්සාහයකට මාඕ සේතුං සහෝදරයා මුල පිරිය. චීනයේ නව ප්‍රජාතන්ත්‍ර විප්ලවීය කාල පරිච්ඡේදයේදී ස්ටාලින් සහෝදරයාගේ නායකත්වය යටතේ තුන්වැනි ජාත්‍යන්තරයේ යාන්ත්‍රික උපදෙස් කීපයක්ම ඔහු ඉවත දමා තිබීම හේතුවෙන් සමාජවාදය ගොඩ නැගීම සහ විප්ලවයේ නව ආකාරයන් (උදා - යෙනාන්) නිර්මාණය කළේය. මේ ක්‍රියා මාර්ගයෙන් විශේෂයෙන්ම 1956 සෝවියට් සංගමයේ ප්‍රතිවිප්ලවයෙන් පසු චීනයේ සමාජවාදය ගොඩ නැගීමේ අලුත් මාවතකට මුල පිරීම ඔහු වේගවත් කළේය. (උදා නිෂ්පාදන බල වේගයන්ට වඩා නිෂ්පාදන සම්බන්ධතාවයන්, කාර්මික හා කෘෂිකර්මාන්තයේ සංවර්ධනයේ සමබරතාවය ගම්බද ප්‍රදේශ සහ නාගරික ප්‍රදේශ දෙපයින් හිට ගැනීමේ ක්‍රියා මාර්ග යටතේ) **''මහා ඉදිරි පිම්ම''** වැනි ව්‍යාපාර දියත් කළේය. මතවාදී පදනම සූදානම් කිරීමට **''ශ්‍රේෂ්ඨ සම්බන්ධතාවයන් දහය''** ගැන **''ජනතාව අතර ප්‍රතිවිරෝධයන් නිවැරදිව ග්‍රහණය කර ගැනීම ගැන''** සෝවියට් දේශපාලන ආර්ථික විමර්ශනය වැනි වැදගත් න්‍යායික සංග්‍රහයන් ඉදිරිපත් කළේය. ආර්ථික පදනම සම්පූර්ණයෙන්මත් බහුජනතාවගේ ක්‍රියා මාර්ගය භාවිතාවේ යෙදීමටත් නව පන්නයේ විප්ලවයක් පෙරටු කර ගෙන යාමේ උත්සාහයන් සමග 1965 දී ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවය දියත් කළේය. රාජ්‍යයේ හා පක්ෂයේ උත්තර නිර්මිතයේ විප්ලවීය කැළඹීම් ඇති කිරීමටත් 1976 මාඕ සේතුං සහෝදරයාගේ අභාවය තෙක්, චීනයේ ස්වභාවයත් සියලුම ක්ෂේත්‍රවල ලෝකය සොලවන විප්ලවීය කුණාටුව නිර්මාණය කළේය. ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවය පිළිබඳව අපගේ විග්‍රහය හා ගැඹුරු අධ්‍යයනයේදී පැරිස් කොමියුනය හා ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයෙන් පසු ලෝක නිර්ධන පංතික ව්‍යාපාරයේ ඉහළම මුදුන වූ තුන්වැනි ජයග්‍රහණයයි. ශ්‍රේෂ්ඨ සංස්කෘතික විප්ලවයේ සැබෑ හරය සමාජය, රාජ්‍යය පක්ෂය තුළ අඛණ්ඩව පංති අරගලය සහ ද්වි දර්ශනීය අරගලය (විප්ලවයට පෙර හා පසු) නිර්ධන පංති මතවාදයේ සහ දේශපාලනයේදී බහු ජනතාවගේ ක්‍රියා මාර්ගය භාවිතාවේ යොදන ආකාරය සොයා ගැනීමයි. තවත් වචනයකින් ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයේ **''අභිමතාර්ථය''** උත්තර නිර්මිතයේ (මූලික වශයෙන් පක්ෂය හා රාජ්‍යය) සෑම සියලු ක්ෂේත්‍රයකම නිර්ධන පංති නායකත්වය යටතේ අඛණ්ඩව විප්ලවය ගෙන යාමේ බහුජනතාවගේ ක්‍රියාමාර්ගයේ ක්‍රම හා විධි විමයි. මෙම අවස්ථාවේදී විශේෂයෙන් මතක් කර ගැනීමට වැදගත් බොහෝ ලෙස ප්‍රචාරය වූ සටන්පාඨ සමහරකි. **''කැරලි ගැසීම යුක්ති සහගතය'' ''විප්ලවය වඩදිය බාදිය වලට එරෙහිව නැගී සිටියි.'' ''මධ්‍යස්ථානයට බෝම්බ ගසන්න'' ''පැරිස් කොමියුනයේ ආලෝකයෙන් විප්ලවීය කොමිටි, සමුළු, සංවිධාන, නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය ඉහළින්ම පරිහරණය කරන්ටත් දේශපාලනයෙන් අණ දෙන්න'' ''පුළුල්ව බහු ජනතාව නගා සිටුවන්න''.** වැනි සටන් පාඨ ඔස්සේ බහුජනතාවගේ සහ පංතියේ විප්ලවීය සුපරීක්ෂාකාරීත්වයෙන් රාජ්‍යයේ හා පක්ෂයේ තමන්ට අවශ්‍ය උපකරණ නිර්මාණය කරගති. විප්ලවීය ජයග්‍රාහකයෝ දශලක්ෂ ගණනින් උපදවමින් විප්ලවීය කායසීධරයන්ටට හා බහුජනතාවට, ප්‍රතිගාමීන්ට හා අවස්ථාවාදීන්ට එරෙහිව කැරලි ගසන්ට පෙළඹවීමට මෙයින් මග සලසා දුන්නේය. මේ සියලුම ආකාරයෙන් කෙටි කාලයක් භාවිතාවේ දැමුණි. විප්ලවයට පසු ප්‍රතිවිප්ලවය වශයෙන් නිරන්තරයෙන් පෙළ ගැසෙන විද්‍යාත්මක සත්‍යය ස්ථාවර විය. අපි මෙතැන් සිට ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයෙන් තව දුරටත් දියුණුවීම ගැන කථා කරන විට අද මාක්ස් - ලෙනින් - මාඕවාදයේ සංවර්ධනය නිර්මාණාත්මකව යෙදීමට ආරම්භක ස්ථානය වශයෙන් සළකුණු කරයි. මූලිකවම බහුජනතාවගේ ක්‍රියා මාර්ගය ඇතිකර ගනිමින්, දේශපාලනයෙන් අණ දෙමින් නිර්ධන පංති මතවාදයෙන් පංති අරගලය පක්ෂය තුළත් පිටතත් ද්විදර්ශනීය අරගලයෙන් අඛණ්ඩව මග පෙන්වීම අපි ප්‍රතිපත්තිමය ලෙස වටහා ගත යුතුය.

20 වැනි ශත වර්ෂයේ දෙවැනි ලෝක යුද්ධ සමයේ තිබුණු නරකම තත්ත්වයට (අවපාතයට) ළඟා වෙමින් 70 වේ මැද භාගයේ ආරම්භයත් සමගම ලෝක අධිරාජ්‍යවාදය මුහුණ දී ඇති දරුණුතම අර්බුදයේ විෂය මූලික තත්ත්වයේ නව රැල්ලක් පැවතුණු බවත් ලෝක පරිමාණයේ ප්‍රතිවිප්ලවයෙන් පසු ලෝක පරිමාණ විප්ලවය සඳහා විෂය මූලික තත්ත්වයන් සැකසී ඇති බවත්, ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අලුත් පිබිදීමක් ඇති බවත්, දැකිය යුතුය. ලෝක අධිරාජ්‍යවාදයේ පරිධියේ ඇති නේපාලය වැනි තුන්වන ලෝකයේ පීඩිත රටවල් පවා විප්ලවයේ කුණාටු කේන්ද්‍රස්ථාන බවට පත්වී ඇත. මාක්ස් - ලෙනින් - මාඕවාදය භාවිතාව යෙදවීම ඔස්සේ **''පක්ෂයේ මග පෙන්වන චින්තනය''** ලෙස කැටිකර ගැනීමට හැකිවීමෙන් ක්‍රියා මාර්ගයෙන් නියම කරන ලද මාඕවාදී මහජන යුද්ධයට ඉහළ මට්ටමේ පිම්මක් පැනීමට නේපාලයට හැකිවී ඇත. ලෝක පරිමාණයේ විෂය මූල අර්බුද කාල වලදී ධෛර්යමත්වත් ලෝකයේ ශ්‍රේෂ්ඨ අදහස් හා ශ්‍රේෂ්ඨ විප්ලවයන් බිහිවී ඇති නිසාද, ජාත්‍යන්තර විෂය මූල අර්බුදයේ සංවර්ධනය දෙස අපි මතුපිටින් නොබැලිය යුතුය.

**''විප්ලවාදී න්‍යාය හා ඉතිහාසය පිළිබඳ දැනුමක් ද, වර්තමාන ව්‍යාපරය පිළිබඳ ගැඹුරු අවබෝධයක්ද නොමැතිව ශ්‍රේෂ්ඨ විප්ලවවාදී ව්‍යාපාරයක් ජයග්‍රහණය කරා මෙහෙයවන්නට පක්ෂයකට කිසිසේත් බැරිය.''**

මාඕ සේතුං - (ජාතික යුද්ධයේදී චීන කොමියුනිස්ට් පක්ෂයට ඇති තැන ලිපියෙන්)

මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි.

http:/ / slmarxist.yolasite.com
slmarxist@ymail.com